එරාවූර් නගර සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය
-------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 19 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 19 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට එරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහය ප්‍රකාශ ඉදිරිපත්කර තිබූ නමුත් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව නිසිපරිදි පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව වන රු. 36,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සභාවට අයත් මහජන පුස්තකාලයේ තිබූ පොත්පත් 1400 ක් 2010 වර්ෂයේ ජල ගැල්මෙන් සම්පූර්ණයෙන්ම විනාශයට පත්විය. එය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීමෙන් තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල වත්කම්වල අගය වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මියගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවියයුතු ණය ශේෂය වන රු. 181,871 ක් හිඟ ණය 2010 වර්ෂයේ සිට හිඟව පැවතුනියද ඒවා මරණ පාරිතෝෂිකයන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර දිගටම ගිණුම් ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

(ආ) විවිධ අවශ්‍යතාවයන් සඳහා ලබාදී තිබූ රු. 3,008,425 ක අත්තිකාරම් මුදල වසර 15 ක සිට නිරවුල් කර නොතිබූ අතර එම මුදල් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු නොකර වසර එකොලහක් දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වමින් තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
-----------------------------------

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා තිබූ සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් ගොඩනැගිලි | 85,687,786 | ඉඩම් ඔප්පු |
| යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ | 4,107,929 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලීබඩු සවිකිරීම | 2,999,175 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පරිඝණක | 525,800 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |

1.3.5 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම
-------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදි නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| නගර සභා ආඥා පනත (අධිකාරය 255) | | |
| I | වගන්තිය 177(2) | 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලින් සාරාංශය මහජනයාගේ දැන ගැනීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට සභාව විසින් 2014 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. |
| II | වගන්තිය 180(1) | එක් එක් මුදල් වර්ෂය අවසානයේ එම ගිණුම් වර්ෂයට අදාල පාලන වාර්තාව සභාපතිවරයා විස්තරාත්මකට පිළියෙල කළයුතුය. කෙසේවූවද, එවැනි වාර්තාවක් සමාලෝචිත වර්ෂයේ පිළියෙලකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තික වියදම් රු. 402,649 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 2,881,587 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,284,236 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර සැලකියයුතු විචලනයන් නිරීක්ෂණ විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | අයකළ | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | % |
| වරිපනම් හා බදු | 2,243 | 1,899 | 344 | 15 |
| බදු කුලී | 1,500 | 1,295 | 104 | 13 |
| බදු | 500 | 230 | 270 | 53 |

2.2.2 වරිපනම් බදු සහ බදු

----------------------

නගර සභා ආඥා පනතේ(අධිකාරය 250) වගන්ති 160 අනුව නගර සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලිවලට 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා අයවියයුතු එකතුව රු. 9,550,217 ක වරිපනම්බදු අයකරගෙන නොතිබුණි.

2.2.3 මහජන පොළ බදු

--------------------

මහජන පොළහි පිහිටි කඩ කාමර 40 ක බදු කරුවන්ගෙන් 2008 වර්ෂයේ දක්වා හිඟව පවතින රු. 3,781,815 ක මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

2.2.4 මස් කඩ වාර්ෂික බලපත්‍ර ගාස්තු සහ බදු කුලි

----------------------------------------------

මස් කඩ සඳහාවූ වාර්ෂික බලපත්‍ර ගාස්තු සම්පූර්ණයෙන්ම අදාල වර්ෂයතුල ගෙවා නිමනොකළ පුද්ගලයින් තුන් දෙනෙකුට දිගටම වසර 5 ක් බලපත්‍ර ලබා දී තිබීම හේතුවෙන්. ඒ අනුව 2010 සිට 2014 දක්වාවූ වර්ෂයන් සඳහා අයවියයුතු හිඟ මුදල රු. 540,315 ක් විය.

2.2.5 සිනමා ශාලා බදු

------------------

සිනමා ශාලාවකින් 2010 වර්ෂයේ සිට අයවියයුතු හිඟ විනෝද බදු රු. 860,961 ක මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලොචනය

----------------------------

3.1 කළමණාකරණ දුර්වලතා

----------------------------

පහත පරීක්ෂණය කරනු ලැබේ

(අ) සභාවේ උප සභාපතිගේ නිවාස දුරකථන ගාස්තුව ප්‍රතිපූර්ණය කිරීමේ සීමාව රු. 3000 ක් වූවද 2012 වර්ෂයේ වැඩිපුර ගෙවා තිබූ රු. 12,466 ක් සහ සමාලෝචිත වර්ෂයේදී වැඩිපුර ගෙවාතිබූ රු. 8,307 ක් මුදලද අයකරගෙන නොතිබුණි.

(ආ) 1995 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාව විසින් ගෙවිය යුතුව තිබූ සේවක විශ්‍රම වැටුප් දායක මුදල් රු. 2,777,757 ක් ගෙවියයුතුව තිබුණද, එය පියවීවට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1987 වර්ෂයේ ප්‍රාදේශිය සභා ආරම්භ කිරීමට ප්‍රථම නගර සභාව වශයෙන් ක්‍රියාකළ කාලයේදී විදුලිබල මණ්ඩලය වෙනුවෙන් විදුලි බලය මහජනයාවෙ බෙදාහැර තිබුණි. කෙසේවූවද, 1988 වර්ෂයේ සිට මෙම වාර්තා දිනය දක්වා විදුලිබලය සැපයීම වශයෙන් පාරිභොගිකයන්ගෙන් රු. 786,122 ක් විදුලි ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවට අයත් ට්‍රැක්ටර් යන්ත්‍රය අනතුරට පත්වීම නිසා සභාවට රු. 29,300 ක් පාඩුවක් සිදුවී තිබුණද ඒ සඳහා මු.රෙ. 102 සහ 104 අනුව ක්‍රියාකිරීමට සභාව කටයුතුකර නොතිබුණි.

(ඉ) 1971 අංක 08 දරණ පනතින් සංශෝධනය කරන ලද සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත අනුව තාවකාලික සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබූ සේවකයන් 32 දෙනාගෙන් අයකරගෙන තිබූ සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල වන රු. 384,449 ක් අදාල ආයතන වෙත වර්තා දිනය දක්වා ගෙවා නොතිබුණි.

(ඊ) 2007 සිට 2013 වර්ෂය දක්වා හිඟව තිබූ වනිතාපොළ බදු මුදල වන රු. 150,510 ක් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

3.2 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

----------------------------------

හිටපු ජනාතිපතිවරයාගේ 69 වන ජන්ම දිනය වෙනුවෙන් සුභපැතුම් පණිවුඩය පත්‍රයේ පළ කිරීම සඳහා සභා අරමුදලින් රු. 22,000 ක මුදලක් වැයකර තිබුණි.

3.3 මානව සම්පත් කළමණාකරණය

------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී දෛනික වැටුප් පදනම් මත කායීාල සේවකයින් 40 දෙනකු බඳවාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරික්ෂණ විය.

(I) බඳවා ගැනීමේ පරිපාටිය (Scheme of Recruitment) වගන්තිය 8.4 අනුව, බඳවා ගැනීම් ක්‍රියාවලියන් අනුගමනය නොකර මෙම පත්වීම් ලබා දී තිබුණි.

(II) බඳවා ගැනීමේ පරිපාටියේ ඡෙද අංක 03 අනුව පත්වීම් බලධාරියා පළාත් පාලන අමාත්‍යාංශය (නැගෙනගිර පළාත්) ලේකම් වරයාය. කෙසේ වූවද, මෙම පත්වීම් සභාවේ

ලේකම් විසින් ලබාදී තිබූ අතර 2014 දෙසැම්බර් 31 දින දක්වා රු. මිලියන 7,833 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(III) 2014 දෙසැම්බර් 31 දිනට කාර්යාල සේවක පුරප්පාඩු 08 ක් පමණක් තිබූ අතර එම තනතුරු සඳහා 40 දෙනෙක් බඳවාගෙන තිබුණි.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

අයවැයගත වියදම් සහ තත්‍ය ආදායම් අතර 58% සිට 95% දක්වා විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූබව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පාලනය

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය